විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 03/2019

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2019 ජනවාරි මස 29 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය සහ ශිෂ්‍යාධාර ගෙවීම</u>

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 11/2018 හි 5 වන ඡේදය සංශෝධනය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2019/01/24 දින පැවති සිය 1002 වැනි සභා වාරයේ දී තීරණය කරන ලදි. ඒ අනුව, 11/2018 චක්‍රලේඛයෙහි සංශෝධිත 5 වන ඡේදය අන්තර්ගත කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

2. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වීමත් සමඟ, කොමිෂන් සභා චක්‍රලේඛ අංක 856, 900, 942 සහ 11/2018 අවලංගු වේ.

**3. ශිෂ්‍යාධාර සඳහා අයදුම් කිරීමට සුදුසුකම්**

ඕනෑම ශිෂ්‍යයෙකු පහත දැක්වෙන කොන්දේසි සපුරා ඇත්නම්, ශිෂ්‍යාධාර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

3.1 ශිෂ්‍යයා ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

3.2 ඔහු/ඇය විශ්වවිද්‍යාලයක/උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීම සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි විය යුතුය.

**3.3 දෙමව්පියන්ගේ ආදායම් සීමාව**

(අ) 2017/2018 අධ්‍යයන වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාත්මක වන පරිදි දෙමව්පියන්ගේ ආදායම වාර්ෂිකව රුපියල් 500,000 /- ට සමාන හෝ ඊට අඩු විය යුතුය.

(ආ) 2017/2018 අධ්‍යයන වර්ෂය සහ ඉන් ඉදිරියට ලියාපදිංචි වන සිසුන් සඳහා ඉහත ආදායම් සීමාව ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනය වන විට කිසිදු මූල්‍යාධාරයක් නොලබන ශිෂ්‍යයන්, ඔවුන්ගේ දෙමව්පියන්ගේ ආදායම ප්‍රතිශෝධිත සීමාවන් තුළ ඇත්නම්, ශිෂ්‍යාධාර ලබා ගැනීමට අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

3.4 ඉහත 3.3 හි දක්වා ඇති පරිදි පහත දැක්වෙන සහන, ආදායම් සීමාවට එකතු වේ.

(අ) වයස අවුරුදු 19 ක් හෝ ඊට අඩු වයසේ පසුවන උපරිම වශයෙන් දරුවන් තිදෙනකු දක්වා පාසැල් යන සහෝදරයෙක් /සහෝදරියක් සඳහා රු.24,000 /- බැගින්.

(ආ) ශ්‍රී ලංකාවේ ඕනෑම විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන පාඨමාලාවක් හදාරන එක් සිසුවෙකුට රු.36,000/- බැගින් දෙවන දරුවාගේ සිට ඉහලට ලබා දෙන අතර මෙම සුදුසුකම තීරණය වන්නේ පළමු දරුවා ශිෂ්‍යාධාර/මහපොළ ලබා නොගන්නේ නම් පමණි.

3.5 ශිෂ්‍යාධාර ලබා දීම සඳහා සිසුන්ව තෝරා ගැනීම සිදු කරන අවස්ථාවේ දී, සිසුන්ගේ දෙමව්පියන් වෙන් වී එහෙත් එය සනාථ කිරීම සඳහා ලියකියවිලි සාක්ෂි ඉදිරිපත් කර හෝ එකී වෙන් වීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර නොමැති අවස්ථාවක දී, අදාළ පොලිස් කොට්ඨාශයේ වාර්තාව සමඟ ග්‍රාම නිලධාරී වාර්තාව ලැබීමෙන් අනතුරුව ආදායම් සීමාව තීරණය කිරීම සිදු කරයි.

3.6 ශිෂ්‍යයා රැකියාවක නියුතු වන්නේ නම්, එම රැකියාවෙන් ලබා ගන්නා ඔහුගේ/ඇයගේ ආදායම, දෙමව්පියන්ගේ ආදායමට එකතු කළ යුතු වේ.

3.7 ශිෂ්‍යයා රැකියාවක නිරතවන්නේ නම් සහ විවාහක නම්, එම ශිෂ්‍යයා සහ කලත්‍රයා වෙනම පවුලක් ලෙස සැලකිය යුතු අතර මෙම චක්‍රලේඛයේ 3.3 සහ 3.4 වගන්තිවල නිශ්චිතව දක්වා ඇති නීති සහ රෙගුලාසි අනුව ශිෂ්‍යාධාර ලබා දීම සඳහා ඔහුගේ/ඇයගේ සුදුසුකම් තීරණය කරනු ලබයි.

**4. සිසුන් තෝරා ගැනීම**

**4.1 පළමු වසර සිසුන් තෝරා ගැනීම**

(අ) විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් ශිෂ්‍යාධාර අයදුම්පත්, ලියාපදිංචි වීමේ ලියකියවිලි සමඟ සිසුන් වෙත යැවිය යුතුය.

(ආ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද ශිෂ්‍යාධාර අයදුම්පත සති 3 ක් ඇතුළත හෝ ශිෂ්‍යයාගේ ලියාපදිංචි වීමේ ඉල්ලුම් පත්‍රය සමඟ විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය වෙත ලබා දිය යුතුය.

(ඇ) ශිෂ්‍යාධාර සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍යයින්ගේ ලැයිස්තුව, ඉහත (ආ) ඡේදයේ සඳහන් පරිදි අවසන් දින සිට මසක් ඇතුළත ප්‍රකාශයට පත් කළ යුතුය.

(ඈ) සුදුසුකම් ලබන සිසුන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම අධ්‍යයන වර්ෂය ආරම්භ වීමෙන් මාසයක් ඇතුළත ආරම්භ කළ යුතුය.

4.2 වාර්ෂික තෝරා ගැනීම

මෙම චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව, විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය විසින් වාර්ෂික තේරීම සිදු කරනු ලබයි.

5. ශිෂ්‍යාධාර වාරිකයක වටිනාකම

මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට ශිෂ්‍යාධාර සඳහා සුදුසුකම් ලබා ඇති සියළුම සිසුන් ද ශිෂ්‍යාධාර ලැබීමට යෝජිත සිසුන් ද එකම ශිෂ්‍යාධාර කාණ්ඩයක් යටතේ (කුසලතා සහ සාමාන්‍ය ලෙස කාණ්ඩ දෙකකට වර්ග නොකර) තෝරා පත්කර ගත යුතු අතර ඒ අනුව ඔවුන්ට මසකට රු. 4000/-ක ශිෂ්‍යාධාර වාරිකයක්, වසරකට වාරික 10ක උපරිමයකට යටත්ව ගෙවිය යුතු වේ.

6. ශිෂ්‍යාධාර ගෙවීම් සම්බන්ධයෙන් වන වෙනත් කොන්දේසි

6.1 අසත්‍ය හෝ වැරදි ප්‍රකාශ ලබා දෙන සිසුවෙක් හෝ තම අයදුම්පතේ කිසියම් කරුණක් හෙළි කිරීමට අපොහොසත් වන සිසුවෙක්, ඔහුගේ/ඇයගේ විශ්වවිද්‍යාලයේ/උසස් අධ්‍යාපන ආයතනයේ අභ්‍යන්තර ශිෂ්‍යභාවය අවලංගු කිරීමට යටත් විය යුතුය.

6.2 ශිෂ්‍යාධාර සඳහා අයදුම් කර ඇති හෝ ශිෂ්‍යාධාර ලබන සිසුන් විසින් පවුලේ ආදායම, විවාහක තත්ත්වය, රැකියාවේ ආදායම ආදියෙහි සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන්, විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා හෝ ආයතනයේ අධ්‍යක්ෂ වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

6.3 ශිෂ්‍යාධාර නොලබන සිසුන් හට ඔහුගේ/ඇයගේ දෙමව්පියන්ගේ ආදායම ස්වභාවික හෝ වෙනත් හේතුවක් නිසා වෙනස් වුවහොත් හෝ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයාට හෝ ආයතනයේ අධ්‍යක්ෂකවරයාට එය පිළිගත හැකි නම්, ඔවුන්ට ශිෂ්‍යාධාර සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.

6.4 විශ්වවිද්‍යාලයේ/උසස් අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනය ලබන කාලය තුළ පමණක් ශිෂ්‍යාධාර ගෙවීම කළ යුතුය. ශිෂ්‍යාධාර ලබා ගන්නා තැනැත්තා කිසියම් හේතුවක් නිසාවෙන් අධ්‍යයන පාඨමාලාව තාවකාලිකව අත්හිටුවන්නේ නම් හෝ අධ්‍යයන පාඨමාලාව සම්පූර්ණ කිරීමට ප්‍රථම විශ්වවිද්‍යාලයෙන්/උසස් අධ්‍යාපන ආයතනයෙන් පිටව යන්නේ නම් ඒ පිළිබඳව විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයාට හෝ ආයතනයේ අධ්‍යක්ෂ වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

6.5 ඕනෑම ශිෂ්‍යයෙකුට ශිෂ්‍යාධාර ගෙවීම, පහත සඳහන් හේතුවලින් එකක් හෝ කිහිපයක් නිසා සම්පූර්ණයෙන්ම හෝ තාවකාලිකව අත්හිටුවීමට හැකිය.

(අ) යම් ශිෂ්‍යයෙක් කිසියම් විභාගයක් සම්පූර්ණයෙන්ම සමත්වීමට අපොහොසත් වීමක දී හැර, පළමු වසරේ විභාගයට පෙනී සිටි ඕනෑම ශිෂ්‍යයෙකු දෙවන වසර සඳහා නිර්දේශිත අධ්‍යයන පාඨමාලාව හදාරමින් සිටී නම්, එම ශිෂ්‍යයාට ශිෂ්‍යාධාර ගෙවීම කළ යුතුය.

(ආ) ශිෂ්‍යයෙකු තම අධ්‍යයන කටයුතු උනන්දුවෙන් සිදු නොකරන්නේ නම්.

(ඇ) ශිෂ්‍යයෙකු අවිනීතව හැසිරෙන්නේ නම්.

(ඇ) ඕනෑම වෙනත් වලංගු හේතුවක් සඳහා විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතනවල (විශ්වවිද්‍යාල බලධාරීන්) පාලන මණ්ඩලයේ අභිමතය පරිදි තීරණය කරනු ලැබේ.

6.6 අත්හිටුවා හෝ තාවකාලිකව අත්හිටුවා ඇති ශිෂ්‍යාධාර නැවත ලබා දීම සම්බන්ධ කරුණුවල දී, විශ්වවිද්‍යාල බලධාරීන් තම අභිමතය භාවිතා කළ යුතුය.

6.7 සුදුසුකම්ලත් සෑම ශිෂ්‍යයෙකුටම අධ්‍යයන වර්ෂයක් සඳහා උපරිම මාසික වාරික 10 ක් ගෙවනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව කවර තත්වයක් යටතේ වුවද මාසික වාරික 10ට වඩා අඩුවෙන් හෝ ඊට වඩා වැඩියෙන් ගෙවීම සිදු නොකළ යුතුය.

6.8 මහපොළ ශිෂ්‍යත්වවලට අදාළ කොන්දේසි සාමාන්‍යයෙන් ශිෂ්‍යාධාර සඳහා ද අදාළ වේ.

6.9 මහපොළ ශිෂ්‍යත්වය ලබා ගන්නා ශිෂ්‍යයන් හට ශිෂ්‍යාධාර හිමි නොවේ.

**7. 6.1 සිට 6.9 දක්වා සඳහන් පරිදි ශිෂ්‍යාධාර දීමනා ලබා දීමට අදාළ කොන්දේසි ශිෂ්‍යයන්ට දැනගැනීම පිණිස ශිෂ්‍යාධාර අයදුම්පතත් සමඟ ලබා දිය යුතුය.**

**8. ප්‍රගති සමාලෝචන රැස්වීම සහ ශිෂ්‍යාධාර සහ මහපොළ ප්‍රදානයන් ප්‍රතිපූර්ණය කිරීම**

8.1 විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල අරමුදල්වලින් මාසික ශිෂ්‍යාධාර මුදල් ගෙවීමටත් මාසිකව එම මුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රතිපූර්ණය කර ගන්නා ලෙසත් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ. මේ සමඟ අමුණා ඇති ආකෘතිය I සහ ආකෘතිය II මගින් ප්‍රතිපූර්ණය කිරීමේ ඉල්ලීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය.

8.2 මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සෑම විශ්වවිද්‍යාලයක්, ලේඛකාධිකාරීවරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළ යුතුය. මූල්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක සහ ශිෂ්‍ය සුභසාධනය භාර නිලධාරියා කමිටුවේ සෙසු සාමාජිකයන් වන්නේය.

8.3 පහත දැක්වෙන ආකෘති පත්‍ර III යොදා ගනිමින් කාර්තුමය පදනම මත මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම පිළිබඳ ප්‍රගති වාර්තාවක් සෑම විශ්වවිද්‍යාලයක් විසින්ම (8.2 ඡේදයේ සඳහන් කමිටුව) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

අ) 01 කාර්තුව - අප්‍රේල් මස 20 වන දින හෝ ඊට පෙර

ආ) 02 කාර්තුව - ජූලි මස 20 වන දින හෝ ඊට පෙර

ඇ) 03 කාර්තුව - ඔක්තෝබර් මස 20 වන දින හෝ ඊට පෙර

ඈ) 04 කාර්තුව - ජනවාරි මස 20 වන දින හෝ ඊට පෙර

8.4 සෑම වර්ෂයකම අවසානයේ ශිෂ්‍යාධාර/මහපොළ ශිෂ්‍යත්වලාභීන්ගේ තථ්‍ය සංඛ්‍යාව සහ ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම්වල තථ්‍ය ප්‍රමාණයන්, මේ සමඟ අමුණා ඇති ආකෘති

පත්‍ර IV සහ ආකෘති පත්‍ර V අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

9. මේ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු දැන ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර 011-2123485 යන දුරකථන අංකය ඔස්සේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී අමතන්න.

**10. 2019.01.01 දින සිට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වේ.**

අ.කළේ. **මහාචාර්ය මොහාන් ද සිල්වා**
සභාපති

පිටපත් :

1. ලේකම්/ නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
5. පීඨාධිපතිවරුන්
6. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
7. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
8. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
9. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
12. අභ්‍යන්තර විගණක/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
13. විගණකාධිපති

ලිපි ගොනු අංක: යූජීසී/ එෆ්9/ ශිෂ්‍යාධාර/2018